# අභ්‍යන්තර සටහන

## පළාත් මහ රෝහල - බදුල්ල

| | |
|---|---|
| දිනය | 2023.02-01 |
| වෙත | සියලුම විශේෂඥ වෛද්‍ය නිලධාරීන් |
| වෙතින් | අධ්‍යක්ෂ |
| පිටපත් | තොරතුරු තාක්ෂණ නිලධාරී |
| විෂයය | ප්‍රතිකාර අවසන්ව රෝහලෙන් බැහර කිරීමට සටහන් කළ රෝගීන් පිටත් කර හැරීම ප්‍රමාදවීම වැළැක්වීම |
| යොමු අංකය | BD/GH/CPMA/1/2013 |

ප්‍රතිකාර අවසන්ව රෝහලෙන් බැහැර කිරීම සටහන් කළ රෝගීන්ගේ රෝග නිශ්චය පත හා ලබා ගත යුතු ඖෂධ වට්ටෝරු ලබා දී ඔවුන් පිටත් කර හැරීම බොහෝ ප්‍රමාද වන බවට රෝගීන්ගෙන්, ඔවුන්ගේ ඥාතීන්ගෙන්, නාමික හා නිර්නාමික ලිපි මගින් මෙන්ම දුරකතන ඇමතුම් මගින් ද රෝහල් කමිටු සාමාජිකයින්ගෙන් ද මා වෙත පැමිණිලි ලැබී ඇති අතර මෙවැනි අවස්ථාවක් පිළිබඳව රෝගියෙකුගේ ඥාතියෙකු පැමිණිල්ලක් සිදුකළ බවට දැනුම් දීමක් බදුල්ල පොලීසියෙන් ද සිදු කරන ලදි.

ඒ අනුව රෝහල් තත්ත්ව කළමනාකරණ ඒකකයට මවිසින් ලබා දුන් උපදෙස් පරිදි සිදුකළ සමීක්ෂණයකට අනුව එසේ ප්‍රමාදයක් සිදුවන බවට සියයට අනූවක පමණ ප්‍රතිශතයක පිරිසක් ප්‍රකාශ කර ඇත. එමෙන්ම මෙම ප්‍රමාදය හේතුවෙන් ප්‍රවාහන පහසුකම් සපයා ගත නොහැකිව එදිනම නිවසට යාමට නොහැකිවූ බවට හා ආර්ථික අපහසුතා උපරිම මෙම කාලයේ අධික ගාස්තු ගෙවා කුලී රථ වලින් නිවසට යාමට සිදුවූ බවට ද චෝදනා කර ඇත.

එබැවින් රෝගියෙකු රෝහලෙන් බැහර කිරීමට සටහන් කිරීමෙන් පසු අවම කාලයක් තුල නිවසට පිටත් කර හැරීම සඳහා ඔබ ඒකකයේ නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් දෙමින් හා එම කටයුතු අධීක්ෂණය කරමින් මෙම තත්ත්වය වැළැක්වීමට දැඩි අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

**Dr. Upul Karunarathne**
MBBS.MSc (Med.Admin). MD(Med.Admin)
Director
Provincial General Hospital
Badulla.